සැ. යු. — 2013.12.20 දින පළ වූ අංක 1,842 දරන ගැසට් පත්‍රයේ I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,843 - 2013 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2013.12.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 4156 |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 4157 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* -(i) දයා සරණ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 දෙසැම්බර් මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජනවාරි මස 17 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජනවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4155- B 80797— 3,400 (2013/12)
F 1 -

# ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

**1987 අංක 42 දරන පළාත් සභා පනතේ IV වන කොටසේ 32 (1) වන වගන්තිය යටතේ වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් කරන ලද පත්වීම්**

| අනු. අංකය | නම/සේවය/පන්තිය | පත්කරන ලද තනතුර/කාර්යාලය ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|
| 01 | ආර්. එම්. එස්. එන්. රාජපක්ෂ මහත්මිය<br>ශ්‍රී. ලං. ප. සේ. III පන්තිය | 2012.12.03 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් තනතුර සඳහා, |
| 02 | පී. ජේ. ආර්. ඒ. ඩබ්. සී. රණසිංහ මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. I පන්තිය | 2012.12.03 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වාරියපොල, වයඹ පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා, |
| 03 | කේ. එම්. පී. ඩී. ජයම්පති මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. III පන්තිය | 2013.01.17 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ, සහකාර ලේකම් තනතුර සඳහා, |
| 04 | ඩබ්. ආර්. ආර්. පී. විජේරූප මහත්මිය<br>ශ්‍රී. ලං. ප. සේ. III පන්තිය | 2013.02.01 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් මාර්ග සංවර්ධන, විදුලිබල, නිවාස හා ඉදිකිරීම් සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් තනතුර සඳහා, |
| 05 | ආර්. එම්. ඩී. ජයවර්ධන මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. III පන්තිය | 2013.06.03 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, හලාවත නගර සභාවේ, ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා, |
| 06 | කමල් අමරසිංහ මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. I පන්තිය | 2013.06.12 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ඔබගේ නිත්‍ය තනතුරට අමතරව, පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුවේ, පරිවාස හා ළමා රක්ෂක කොමසාරිස් තනතුරේ වැඩ බැලීම සඳහා, |
| 07 | ටී. බී. වික්‍රමසිංහ මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. I පන්තිය | 2013.06.12 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් සභා ලේකම් කාර්යාලයේ, සභා ලේකම් තනතුර සඳහා, |
| 08 | පී. බී. එම්. සිරිසේන මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. (විශේෂ පන්තිය) | 2013.06.12 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ ප්‍රධාන අමාත්‍යාංශයේ, ලේකම් තනතුර සඳහා, |
| 09 | පී. ඩී. එස්. කේ. ගුණපාල මෙනෙවිය<br>ශ්‍රී. ලං. ප. සේ. III පන්තිය | 2013.07.15 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ඔබගේ නිත්‍ය තනතුරට අමතරව, වාරියපොල වයඹ පුහුණු ආයතනයේ, අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා, |
| 10 | පී. ජේ. ආර්. ඒ. ඩබ්. සී. රණසිංහ මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. I පන්තිය | 2013.07.15 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ, පරිවාස හා ළමා රක්ෂක සේවා කොමසාරිස් තනතුර සඳහා, |
| 11 | වෛද්‍ය ඊ. ඒ. ආර්. ඩී. එදිරිසිංහ මහත්මිය<br>ශ්‍රී. ලං. ආයු. වෛ. සේ. I පන්තිය | 2013.07.08 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය/සහකාර කොමසාරිස් තනතුරෙහි වැඩ බැලීම සඳහා, |
| 12 | එම්. ඒ. දයාරත්න මහතා<br>ශ්‍රී. ලං. ග. සේ. I පන්තිය | 2012.09.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර සඳහා, |
| 13 | ඩී. එම්. ඩී. එස්. දිසානායක මහතා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/I පන්තිය | 2013.04.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වාරියපොල විධායක ඉංජිනේරු කාර්යාලයේ, විධායක ඉංජිනේරු තනතුර සඳහා, |
| 14 | කේ. ජී. එන්. ගාල්ලගේ මහතා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/II පන්තිය | 2013.01.01 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ, මූලස්ථාන ඉංජිනේරු තනතුර සඳහා, |
| 15 | ඩබ්. එස්. ජයතිලක මහතා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/II පන්තිය | 2013.01.28 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, මහව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ, ප්‍රාදේශීය ඉංජිනේරු තනතුර සඳහා, |
| 16 | එම්. පී. පී. නවරත්න මහතා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/I පන්තිය | 2013.01.28 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, කුරුණෑගල ප්‍රධාන කාර්යාලයේ, ප්‍රධාන ඉංජිනේරු (වාරිමාර්ග) තනතුර සඳහා, |

| *අනු. අංකය* | *නම/සේවය/පන්තිය* | *පත්කරන ලද තනතුර/කාර්යාලය ක්‍රියාත්මක වන දිනය* |
|---|---|---|
| 17 | ඒ. එම්. සී. බී. අධිකාරි මහතා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/II පන්තිය | 2013.01.28 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, කුරුණෑගල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ, ප්‍රාදේශීය ඉංජිනේරු තනතුර සඳහා, |
| 18 | ජී. ඒ. කේ. එම්. බණ්ඩාර මහතා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/II පන්තිය | 2013.01.28 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, පුත්තලම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ, ප්‍රාදේශීය ඉංජිනේරු තනතුර සඳහා, |
| 19 | ඊ. එම්. එස්. බී. ඒකනායක මහතා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/II පන්තිය | 2013.01.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි කුරුණෑගල, ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ, ඉංජිනේරු තනතුර සඳහා, |
| 20 | කේ. ඒ. නන්දසිරි මහතා<br>ශ්‍රී. ලං. කෘ. සේ. I පන්තිය | 2013.01.03 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් සැළසුම් හා මෙහෙයුම් කාර්යාලයේ, (ශ්‍රී ලං. කෘ. සේ. I පන්තිය) අධ්‍යක්ෂ (සැළසුම්) තනතුර සඳහා, |
| 21 | ඩී. එම්. සී. කේ. දිසානායක මහත්මිය<br>ශ්‍රී. ලං. කෘ. සේ. II පන්තිය | 2013.01.01 දින සිට ක්‍රියාත්මත වන පරිදි වයඹ පළාත් සැළසුම් හා මෙහෙයුම් කාර්යාලයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැළසුම්) තනතුර සඳහා, |
| 22 | ඩබ්ලිව්. එම්. එස්. වන්නිනායක මහතා<br>සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | 2012.12.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔබගේ නිත්‍ය තනතුරට අමතරව, ගල්ගමුව කලාපීය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා, |
| 23 | කේ. එම්. ඒ. සුකුර් මහතා<br>ශ්‍රී. ලං. කෘ. සේ. II/I පන්තිය | 2013.07.04 දිනැති ලිපියෙන් වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, දැනට පුරප්පාඩුව පවතින ආණමඩුව කලාපයේ, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා. |

ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි,

එන්. පී. එම්. කාරියවසම්,
වයඹ ආණ්ඩුකාරවර ලේකම්.

2013 ඔක්තෝබර් මස,
වයඹ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

12-987

# පළාත් සභා නිවේදන

## පළාත් සභා නිවේදන

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමග කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත යටතේ නියෝගය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමග කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2 (2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, පරිසර, සංචාරක, ආයෝජන සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදාහැරීමේ අමාත්‍ය ජයසේකර පතිරන්නැහැලාගේ දයාසිරි පද්මකුමාර ජයසේකර වන මම වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්ට සහාය වීමට පත් කර ඇත්තා වූ මීට අමුණා ඇති උපලේඛනයේ 1 තීරුවෙහි සඳහන් අයට 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති රීති මාලාව යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III තීරුවෙහි සඳහන් සියලුම බලතල එකී උපලේඛනයේ II වැනි තීරුවෙහි සඳහන් දින සිට මෙයින් පවරමි.

ජයසේකර පතිරන්නැහැලාගේ දයාසිරි පද්මකුමාර ජයසේකර,
වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා
ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා
පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික
කටයුතු, ඉඩම්, පරිසර, සංචාරක, අයෝජන සම්බන්ධීකරණ,
සමුපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා
බෙදා හැරීමේ අමාත්‍ය.

2013 ඔක්තෝබර් මස 23 වැනි දින,
කුරුණෑගල දී ය.

**උපලේඛනය**

| *I වන තීරුව* | *II වන තීරුව* | *III වන තීරුව* |
|---|---|---|
| දෝතිමුනි ෂෙල්ටන් සෝමප්ප්‍රිය මෙන්ඩිස් | 2013.04.05 | සමුපකාර සමිති පනතේ 3,5,6,7,8,9,33,39,44, [44(6) හැර] 45,46,48,49,50,52,53,54,58 [58(3) සහ 58(5) හැර] 59, 68 සහ 72 යන වගන්ති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල රීති මාලාවේ 4,11,15,16,(II) 18,19,27,32,33,35,37,39,40,41,42,43,48,49 [49 (XI) හැර] 51, 52 සහ 53 දරන රීති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල. |

12-1167

---

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ නේවාසික සඳහා ඉඩම් ලබා දීමට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 837 කුරු/නගරය/බටහිර වසමේ පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම පිළිබඳ වූ නිවේදනයයි**

1. පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2014 පෙබරවාරි මස 20 වැනි දින පෙ. ව. 9.00 ට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*(අ)* දිස්ත්‍රික්කය : කුරුණෑගල
*(ආ)* උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය : කුරුණෑගල
*(ඇ)* ග්‍රාම නිලධාරි කොට්ඨාසය හෝ කොට්ඨාස : 837 නගරය බටහිර
*(ඈ)* ඉඩම් පිහිටි ගම් : හකුරුකැටියාව
*(ඉ)* ඉඩමේ නම : කටුවාවේවත්ත
*(ඊ)* ඉඩමේ පිහිටීම : කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ
*(උ)* අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය : නේවාසික කටයුතු සඳහා
*(ඌ)* අන්සතු කරනු ලබන ඒකකය : පදිංචිය සඳහා පර්. 11 සිට පර්. 13 දක්වා ප්‍රමාණයේ කොටස්

2. 2008/4 චක්‍රලේඛය අනුව රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් ලබාගැනීම සඳහා ලියාපදිංචි වී ඇති පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.

රජයේ ඉඩම් ආඥාපනත යටතට අයත්වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි සාධක ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

3. සියලුම ඉල්ලුම්පත්‍ර 2014.01.30 වැනි දින හෝ ඊට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කුරුණෑගල" යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කළ යුතු ය.

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2014.02.20 වැනි දින පෙ.ව. 9.00 ට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට හෝ ඇයට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම ඉල්ලුම්කරුවෙකුම පෞද්ගලිකව පැමිණිය යුතු ය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. අවසර පත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තෝරාගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා වුව ද එම ඉඩම වෙනුවෙන් නියම කරනු ලැබූ මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත් තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැණුම් මිළට හිලව් කරනු ලැබේ.

7. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් ඔවුන් ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවල දී ලබා ගත හැක.

(i) පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ) - පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, කුරුණෑගල
(ii) ප්‍රාදේශීය ලේකම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කුරුණෑගල

ජේ. එම්. ආර්. පී. ජයසිංහ,
පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ).

2013 දෙසැම්බර් මස 11 වැනි දින.

ඉල්ලුම් පත්‍රයේ සහ දිවුරුම් ප්‍රකාශයේ ආදර්ශ ආකෘති පහතින් දක්වා ඇත :-

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ නේවාසික සඳහා ඉඩම් ලබා දීමට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 837 කුරු/නගරය/බටහිර වසමේ පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම පිළිබඳ වූ ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :————.
2. ජාතික හැඳුනුම්පත් අංකය :————.
3. (i) ලිපිනය :————.
   (ii) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :————.
   *(අ)* ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
   *(ආ)* එහි පදිංචි කාලය :————.
4. ගෘහ මූලික අංකය :————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
6. වයස (අයදුම්පත් භාරගන්නා අවසාන දිනට) :————.
7. උපන් දිනය :————.
8. විවාහක/අවිවාහක බව :————.

9. රැකියාව :————.
10. රැකියාව කරන ස්ථානය :————.
11. අයදුම්කරු කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු පවුලේ වාර්ෂික ආදායම :

| නම | අයදුම්කරුට ඇති සම්බන්ධය | රැකියාව | වාර්ෂික ආදායම |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |
| (iv) | | | |
| (v) | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර :

| ඉඩමේ නම | ප්‍රමාණය | අයිතියේ ස්වභාවය | හවුලේ පරවේණි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස් |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |

(නිවාස සහ දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය :————.
14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය : (තමාගේ ද?/බද්දට ද?/කුලියට ද?/අනවසරයෙන් ද? යන වග) :————.
15. නිවස පිහිටි ස්ථානය :————.
16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :————.
17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන පාසලේ නම | ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |
| (iv) | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිල දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද? එසේ නම් පහත විස්තර සපයන්න :

(i) ලබාගත් ණය මුදල :————.
(ii) ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :————.
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :————.

19. පවුලේ යම් සාමාජිකයෙකු මුදල් ඉතිරි කර තිබේ ද? තිබේ නම් පහත විස්තර සපයන්න :

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය | ඉතිරි කළ මුදල |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |

20. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩම ප්‍රමාණවත් පරිදි සංවර්ධනය කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍ය බව පැහැදිලි වුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉහත අයදුම්කරු විසින් ඡේද 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

නම :————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

අනු අත්සන් කරමි.

————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

නම :————.
ලිපිනය :————.

## දිවුරුම් ප්‍රකාශය

'........................................ දිස්ත්‍රික්කයේ.................................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ...................................... ග්‍රාම නිලධාරි වසමේ.............................. පදිංචි............................................ වන මම, පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද මාගේ කලත්‍රයා ට ද සහ වයස අවුරුදු 18 ට අඩු මාගේ දරුවන් ට ද සාමුහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1793 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේ ම ඉහත කී අක්කර .................. රූඩ්. ..................... පර්. ..................... ක් වූ ඉඩම් පවරා ගැනීමෙන්, මිල දී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත් වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

..............................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

————,
සාමදාන විනිශ්චයකාර තැන.

12-1225

**නැගෙනහිර පළාත් සභාව**

2013 අංක 4 දරන විසර්ජන ප්‍රඥප්තිය (පරිපූරක විධිවිධාන) 2013 දෙසැම්බර් මස 02 වැනි දින සභා සම්මත කරන ලද බවත්, මේ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2013 දෙසැම්බර් මස 05 වැනි දින ලැබී ඇති බවත් මෙයින් දන්වමි.

කේ. කරුණාගරන්,
සභා ලේකම්,
නැගෙනහිර පළාත් සභාව.

2013 දෙසැම්බර් මස 06 වැනි දින.
සභා ලේකම් කාර්යාලය,
නැගෙනහිර පළාත් සභාව,
ඇතුල් වරාය පාර,
ත්‍රිකුණාමලය.

12-1231

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.